# ලාහුගල, කොටවෙහෙර හෙවත් පුරාණ දීගලක මහා විහාර පුරාවිද්‍යා ගවේශනය

සුමේධ වීරවර්ධන, චන්දිම අඹන්වල

## හැඳින්වීම

- නැගෙනහිර පළාතේ විවිධ ප්‍රදේශ වල සංචාරය කිරීමෙන් ඇති වූ කුතුහලය හා උනන්දුව මෙම ගවේෂණාශය අප තුළ ඇතිකරන ලදි.
- සි.ඩබ්ලියු. නිකලස්, ගුනපාල සේනාධීර හා එල්ලාවල මෙධානන්ද හිමියන් විසින් සිදුකර ඇති මෙහෙවර මෙම ගවේෂණය සඳහා ගුරු විය.
- මෙම ගවේෂණය මඟින් මීට ඉහත පර්යේෂකයින් විසින් ලබා දී ඇති තොරතුරු අතික්‍රමණය කිරීමට හැකි විය.
- මෙම පුරාවිද්‍යා ස්ථානය ප්‍රසිද්ධ වී ඇත්තේ **ලාහුගල දාගැබ**/ ලාහුගල **කොටවෙහෙර** / **කොටවෙහෙරගල** / **කොටගල්වෙහෙර** යනුවෙනි.
- අභිලේඛන වල මෙම ස්ථානය **දීගලක මහ විහාරය** නමින් හඳුන්වා ඇත.


# ක්ෂේත්‍රය හා පිවිසීම

- නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍ර.ලේ. කොට්ටාසයේ **පංසල්ගොඩ** ග්‍රා.නි. වසමේ ස්ථානගත වී ඇත.
- නිරපේක්ෂ ස්ථානගත වීම,

  උ. අක්ෂාංශ $6^0$ 52’ 42'52”

  නැ. දේශාංශ $81^0$ 45’ 09'79”

- මොණරාගල-පොතුවිල (A4) මාර්ගයේ සියඹලාන්ඩුව නගරය හා ලාහුගල කඩමණ්ඩිය පසුකර කිලෝමීටර 3-4ක් පමණ ගමන් කළ විට කොටවෙහෙරට පිවිසෙන ස්ථානයේ බසයෙන් බැසිය හැකි වේ.




(after Somadeva 2011:7)

# පූර්ව අධ්‍යයන

- ඩී.ඊ. වික්‍රමසූරිය 1918
- ඒ.එම්. හෝකාර්ට් 1928
- ගුණපාල සේනාධීර 1963
- එල්ලාවල මේධානන්ද හිමි 1964/2002

# අරමුණු

මෙම පුරාවිද්‍යා ගවේෂණයේ දී පහත අරමුණු මුඛ්‍ය අරමුණු වශයෙන් පැවතින.

- කොටවෙහෙර පුරාවිද්‍යා ස්ථානයේ පවතින අභිලේඛන හා පුරාකෘති පිළිබඳ අධ්‍යයනය කිරීම හා වාර්තා කිරීම
- ප්‍රවාදයන් හි දැක්වෙන ආකාරයට මෙම පුරාවිද්‍යා ස්ථානය දුටුගැමුණු වෘත්තාන්තය හා සම්බන්ධතාවක් දක්වන්නේ ද? එ සේ සම්බන්ධතාවක් ඇත් නම් ඒ කෙබඳු ආකාරයෙන් ද යන්න අනාවරණය කරගැනිම

# උපකරණ

- මෙම අධ්‍යයනය සඳහා උපකරණ හා මෙවළම් සීමිත ප්‍රමාණයක් භාවිත විය.
  - මීටර් 2 මිනුම් පටිය,
  - සටහන් පොත්,
  - අංකිත කැමරාව
  - හඬ පටිගතකරණය

# ගවේෂණ විස්තරය

- **ප්‍රධාන පිවිසුම :** ගලේ නෙලන ලද පඩිපෙළක් ඇත. සාමාන්‍ය පළල සෙ.මී. 135ක් හා එක් පඩියෙක පළල සෙ.මී. 30-35 පමණ වේ. මෙ වැනි පඩි 104කින් හා පඩි 18කින් සමන්විත දෙ වැනි පඩිපෙළකින් මෙය සමන්විත ය.
- පළමු පඩිපෙළ අවසන් වීමත් සමඟ සෙ.මී. 170×160 ප්‍රමාණයේ චතුරස්‍රාකාර ගල්පඩියක් ඇත.
- ප්‍රධාන පඩිපෙළේ අඩක් පමණ ගමන් කොට දකුණු පස ගල්තලාවේ පැවති වාස්තු නිර්මාණ වෙත පිවිසීමට හැකි ආකාරයේ කුඩා පඩිපෙළක් දැකගත හැක. එය සෙ.මී. 13×20 බැගින් වන පඩි 8කින් සමන්විත වේ.
- තරමක් ඉහළින් සෙ.මී. 13×20 ප්‍රමාණයේ පඩි 13කින් යුතු පඩිපෙළක් දකුණු දෙසට ම යොමු වී ඇත.




- පඩිපෙළ තරණය කිරීමෙන් පසු අංගනයකට පිවිසිය හැක.
- වත්මන් භික්ෂු නේවාසිකාගාරය ඇත්තේ මෙම අංගණයේ වම්පස ය.
- ධර්මදේශනා පැවැත්වීම සඳහා තාවකාලික මණ්ඩපයක් සකසා ඇත.
- වාස්තු නිර්මාණයකට අයත් ගල්කණු තුනක පහළ කොටස් දැකගත හැක



- ඡත්‍රගලක් ද දැකගත හැකි වේ.
- මෙය සෙ.මී. 148ක විෂ්කම්භයක් සහිත, සියුම් නිමාවකින් යුක්ත වූවකි. මැද දැවකණුවක රැදවීම සඳහා ඇති සිදුර සෙ.මී. 48කින් හා අවසාන දාරමය කවය සෙ.මී. 8 පළලින් යුතු වේ.
- මෙය ස්තූපයන් ඇදහැළුණු ඡත්‍රාවලියට අයත් එකක් වීමට ඉඩ ඇත.




- ඡත්‍රය තදාසන්න ව සෙ.මී. 152×110 ප්‍රමාණයෙ සියුම් නිමාවක් සහිත ගල්පුවරුවක් ඇත.
- එය වජ්‍රාසනයක්/විදුරසුනක් විය හැක.
- මෙම අංගනය තුළ අභිනව බෝධි අංකුරයක් ද රෝපණය කර ඇත.
- මෙම අංගණයේ සිටින විට කෙළින් ම උතුරු දෙසට වන්නට කඳුමුදුනේ ස්තූපය පිහිටා ඇත.



- මෙම මළුවේ සිට ස්තූපය වෙත පිවිසීම සඳහා පිවිසුම් මාර්ග දෙකක් ඇත.
- එයින් සෘජු ව ස්තූපය දෙසට ගමන් ගන්නා පඩිපෙළ ඔස්සේ ගමන් කිරීමෙන් ස්තූප මළුවට දකුණු පසින් පිවිසිය හැකි වේ.
- මෙම පඩිපෙළ වෙනත් ස්ථාන වලින් ගෙනඑන ලද ගල්පඩි යොදාගෙන සකස් කර ඇත.




- එම මළුවට වයඹ දෙසින් ඇති, සෙ.මී. 151×40ක් වූ පඩි 32කින් සමන්විත පඩිපෙළ තරණය කර ස්තූපයට බටහිරින් වූ තැනි භූමියට පිවිසිය හැක.
- මෙම පඩිපෙළ හා ස්තූපයේ දකුණු පිවිසුම අතර අභිලේඛන 2ක් දැකගත හැක.
- මෙම ගල්පඩිපෙළට වම්පස ගල්කුළු කීපයක් පිහිටා ඇති අතර එයින් එක් කුඩා ගල්කුළක මෙම පඩිපෙළට මුහුණ යොමුකරමින් තවත් අභිලේඛනයක් ස්ථානගත වි ඇත.



- මෙම තැනිතලා ප්‍රදේශයේ ඇති ගල්කණු 16කින් සැකසුණු ගොඩනැගිල්ල විශේෂ ය.
- නැගෙනහිරට මුහුණ යොමා ඇති මෙහි කණුවක සාමාන්‍ය උස සෙ.මී. 280කි (පොළොව යට කොටස සෙ.මී. 100ක් හා ඉහළ කොටස සෙ.මී. 180ක් වේ.)
- ඇතුළු ගල්කණුවක දිග හා පළල සෙ.මී. 29 බැගිනි.
- සඳකඩපහණ සෙ.මී. 168×70 කි.
- ස්ථානගත වීම හා ලක්‍ෂණ අනුව මෙම ගොඩනැගිල්ල වැදගත්කමින් ඉහළ ගොඩනැගිල්ලක් විය යුතු ය.
- එය බොහෝවිට පිළිම ගෙයක් විය හැකි වේ.




- මෙම මළුවේ සිට ස්තූපයට පිවිසීම සඳහා සකස් කළ පඩිපෙළක් ඇත. එහි බොහෝ ගල්පඩි ආරක්‍ෂා වී ඇත.
- මෙම පඩිපෙළ ආරම්භක ස්ථානයට වම්පසින් පොකුණකි. ස්වාභාවික ව සැකසී ඇති මෙම පොකුණ පසුව හැඩගන්වා ඇති බව පැහැදිළි වෙයි. මෙම පොකුණ තදබල නියඟයක දී වුවත් නොසිඳෙන බව තතු දත් අය ගේ අද්දැකීමයි.
- මෙහි ගැඹුර සෙ.මී. 130ක් පමණ වන අතර පොකුණට බැසීම සඳහා ගල්පඩි 4ක් ඇත. එක් ගල්පඩියක සාමාන්‍ය පළල සෙ.මී. 30ක් වන අතර දිග සෙ.මී. 217ක් වේ.
- මෙම පොකුණ ඉහළින් දැව ආවරණයක් සකස් කර තිබූ  බව හඳුනාගත හැකි ය.




- පොකුණට උතුරු දෙසින් හා ඉහත දැක් වූ පිළිම ගෙය විය හැකි වාස්තුවිද්‍යා නිර්මාණයට ඉදිරියෙන් තවත් වාස්තුවිද්‍යා නිර්මාණයක් පැවති බව නිරීක්ෂණය කළ හැකි වේ.
- දැව කණු සිටුවීම සඳහා ගලින් සකස් කළ කණු පාදම් ගණනාවක් ශේෂ වී ඇත.




## ස්තූප මළුව

බටහිර පිවිසුමෙන් ස්තූප මළුවට පිවිස දක්ෂිණාවර්ත ව ගමන් කිරීමේ දී හමුවන පුරාකෘති පිළිබඳ ව විස්තර ඉදිරිපත් කරනු ලැබේ.




- **පළමු වැනි සිරිපතුල් ගල :** (සෙ.මී. 98×97) මෙය සියුම් කලාත්මක ලක්‍ෂණ නිරූපණය කරන අතර පාද යුග්මය මිලිමීටර් 2ක පමණ මතුකර දක්වා ඇත. මෙහි කැටයම් තුනි තීරු වශයෙන් දක්වා ඇත.
- **දෙ වැනි සිරිපතුල් ගල :** (සෙ.මී. 101×96) මෙය පළමු සිරිපතුල්ගල හා නිර්මාණ ලක්‍ෂණ අනුව සමරූපී වේ. පතුරු ඉවත් වීම නිසා මෙම සිරිපතුල් ගලේ දකුණු කොටසට හානි සිදු වී ඇත. මෙම සිරිපතුල් ගල මේ වන විට වේදිකාවක් මත තබා පහන් දැල්වීම සඳහා භාවිත කරන අයුරු නිරීක්‍ෂණය කළ හැකි වේ.
- **තෙ වැනි සිරිපතුල් ගල :** (සෙ.මී. 86×84) ස්තූප මළුවේ ඊසාන දෙසින් ස්ථානගත වී ඇත. මෙහි . නිර්මාණ ලක්‍ෂණ අනුව පළමු හා දෙ වැනි සිරිපතුල්ගල් හා සමාන බව දැකිය හැකි නමුත් මෙහි ඡත්‍රයක් සටහන් කර ඇත. මැද ධර්මචක්‍ර නිරූපණය කර ඇති අතර විළුඹ ආසන්නයේ වෘත්තාකාර මංගල ලක්‍ෂණයක් දක්වා ඇත. පාදයන් ගේ ඇඟිලි 5 සියුම් රේඛා මගින් වෙනකර දක්වා ඇත. මෙහි ඇති සිරිපතුල් ගල් අතුරින් මේ ආකාරයට සැරසිලි ලක්‍ෂණ සහිත එක ම සිරිපතුල් ගල මෙයයි.
- **සිව් වැනි සිරිපතුල් ගල :**(සෙ.මී. 57×57) ස්තූපය මුදුනේ දැකිය හැකි කුඩා සිරිපතුල් ගලකි. සමචතුරස්‍රාකාර හැඩයක් ගනී. චාම් අයුරින් නිරූපණය කර ඇති සිරිපතුල් දෙකෙහි විළුඹ ප්‍රදේශයෙන් පුළුල් චක්‍රයක් නිරූපණය කර තිබීම නිසා විශේෂ කොට සැලකිය හැකි වේ.

- **ඡත්‍රගල :** අංක 1 හා 3 සිරිපතුල් ගල් දෙක අතරමැද ඡත්‍රගලක් දැකගත හැකි අතර මෙය පළමු ව දුටු ඡත්‍රයට වඩා වෙනස් ලක්‍ෂණ නිරූපණය කරයි.
- විශ්කම්භය සෙ.මී. 104කි. මැද සෙ.මී. 14ක විශ්කම්භයෙන් යුතු වළක් ඇත. ඊට බාහිරින් ඇති වලය සෙ.මී. 14කින් ද තෙ වැනි වලය සෙ.මී. 24ක් ද බාහිර පටිය සෙ.මී. 8ක් ද පුළුල් වෙයි. මෙම ඡත්‍ර ගල මැදින් තරමක් උන්නත ස්වාභාවයක් පෙන්නුම් කරයි.
- මෙහි ලක්‍ෂණ අනුව ඡත්‍රාවලියක මධ්‍යයේ පිහිට ඡත්‍රයක් බව උපකල්පනය කළ හැකි වේ. මෙම ඡත්‍රයේ එක් කෙළවරක හතරෙන් එක් කොටසක් පමණ කැඩී වෙන් වී විනාශ වී ගොස් ඇත.

- **යූප කනුව :** ස්තූපයෙ නැගෙනහිරින් යූප කනුවක් දැකගත හැක. එය මුල් ස්වරූපයෙන් ම පවතින බව සිතිය හැක.
- චාම් හා කලාත්මක ලක්‍ෂණ පෙන්නුම් කරන මෙම යූප කනුවේ සම්පූර්ණ දිග සෙ.මී. 464කි. මෙයින් ස්තූපයට සම්බන්ධ වන කොටස සෙ.මී. 160ක් හා මටසිළුටු කර ඇති කොටස සෙන්ටිමීටර් 304 කි. මුදුනේ විශ්කම්භය සෙ.මී. 36ක් වන අතර ම මුදුන සරළ පද්මාකාර ලක්‍ෂණ නිරූපණය කරයි.
- මෙය ලංකාවේ වෙනත් තැන්වල ඇති යූප කණුවල ලක්‍ෂණය හා සමාන වේ.








- **හඳුනා නොගත් ගල් පුවරුව :** යූප කනුව ආසන්නයේ විශේෂ ගල් පුවරුවක් දැකගත හැකි අතර එහි දිග හා පළල සෙ.මී. 191 × 88 කි.
- වම්පස කොටසක් කැඩී ඇත.
- මෙම පුවරුව මධ්‍යයේ යම් වස්තුවක් රැඳවීම සඳහා නෙළූ වෘත්තාකාර ලක්ෂණයක් හා දියර ගලායාමට සැදූ කාණු ලක්‍ෂණ දැකිය හැකි වේ.
- **උදක ධෝවන මණ්ඩපයක්** වශයෙන් භාවිත වීමට ඇති බව අනුමාන කළ හැකි ය.



- **වාස්තුවිද්‍යා නිර්මාණය :** මළුවේ උක්ත ගල්පුවරුව ආසන්නයේ වාස්තුවිද්‍යා නිර්මාණයක් පැවති බව හඳුනාගත හැක.
- දැවකණු සිටුවීම සඳහා කණුමුල් අනුව මෙම නිරීක්ෂණය කළ හැකි අතර මළුව පුරාවිද්‍යා කැනීමට ලක්කර නිසි අයුරින් පාදාගන්නා තෙක් එහි දිග, පළල හෝ ස්වාභාවය පිළිබඳ ව නිගමනය කිරීමට තරම් ප්‍රමාණවත් සාධක නැත.
- ඉහත මණ්ඩපය මෙම ශාලාව තුළ රදවා පැවතියක් බව අනුමාන කළ හැකි අතර අභිෂේක කිරීම වැනි කටයුත්තක් සඳහා මෙම මණ්ඩපය භාවිත වී ඇති බව සිතීම සහේතුක ය.




- **ස්තූපය :** කොටවෙහෙර ස්තූප සම්ප්‍රදාය සිහිගන්වනු ලබන ප්‍රතිසංස්කරණීත ස්තූපයකි.
- කන්දේ උස ම ස්ථානය ස්තූපය පිහිටුවා ඇත.
- මෙයට වසර 60කට පමණ පෙර මෙම ස්තූපය සම්පූර්ණයෙන් ම පාහේ විනාශ කරන ලදුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණය කර ඇත.
- මෙම ස්තූපයේ පේසාව වටා අලංකාර ගල් කුළුණු පෙළක් පැවති බව දැකගත හැකි අතර එයින් එක් කුළුණක හිසක් මළුවේ පළමු සිරිපතුල් ගල ආසන්නයේ පතිත වී ඇත.



- **ප්‍රධාන පිවිසුමට දකුණු පසින් ඇති නිර්මාණ :** ප්‍රධාන පිවිසුමට දකුණු පස ඉදිකිරීම් රැසක් පවතින බව නිරීක්ෂණය කළ හැකි වේ.
- එහි විවිධ මට්ටම් වල දී ඒ ඒ ස්ථාන වෙත ළඟා වීම සඳහා කුඩා ප්‍රමාණයේ ගල්පඩිපෙළවල් පැවත ඇත.
- එක් ස්ථානයක ගල්පඩි පෙළට දකුණු පස කොටස ගල්බෝර දමා විනාශ කර ඇත. එම ස්ථානයේ පැවත අභිලේඛනයක් හෝ වෙනත් සටහනක් "නිධන් සළකුණක්"ය යන මුග්ධ විශ්වාසය අනුව මෙය විනාශ කර ඇත.
- මෙහි කුඩා කේතුකාකාර ආවාටයක් ද ඇත.










- මෙම කලාපය තුළ වන තැනි භූමිය තුළ ගඩොළු ඇතිරීමක් නිරීක්ෂණය කළ හැකි නමුත් ගල්කුළුණු දැකගත නොහැක.
- පවතින සාධක අනුව නිසැක වශයෙන් ම විහාරය හා සම්බන්ධ වාස්තුවිද්‍යා නිර්මාණ වලින් මෙම ප්‍රදේශය සමන්විත වූ බව සිතිය හැක.
- දානශාලාව වැනි පොදු ගොඩනැගිලි මෙම ප්‍රදේශයේ වූ පැවති බව උපකල්පනය කළ හැක.
- මෙම කලාපයේ වූ ගඩොළු ඇතිරුම හා වාස්තුවිද්‍යා නිර්මාණ දැව හා වෙනත් ඓන්ද්‍රීය ද්‍රව්‍ය භාවිත කරමින් සිදුකර තිබූ බව උපකල්පනය කළ හැකි වේ.


- **ප්‍රධාන පිවිසුමට වම්පසින් වූ නිර්මාණ** : ප්‍රධාන ගල් පර්වතයේ ම කොටසක් වන මෙහි නෙලන ලද ගල්පඩි පෙළ කීපයක් දැකගත හැක.
- මෙම ප්‍රදේශයේ ද ගල්කණු දැකගත නොහැක. මෙම ස්ථානය ද දැව හෝ වෙනත් ඓන්ද්‍රිය දෑ යොදාගනිමින් විවිධ නිර්මාණ කර තිබූ බව සිතිය හැකි වේ.
- ගල්පඩි ආශ්‍රිත ව වතුර ගලා ඒම වැලැක් වීම සඳහා කානු නෙලා ඇත. උස ම ස්ථානයේ වූ එ වැනි ගල්පඩිපෙළක් තදාශ්‍රිත පිහිට කානුවක් **නෙළුම් පොහොට්ටුවක්** වශයෙන් හඳුන්වයි.
- අවියත් ජනයා ගේ ඇදහිල්ල මේ නිධන් ලකුණු බවයි.




- පහත පිහිටි ස්ථානයක් නිර්මාණ සඳහා කළුගල් ලබාගත් ස්ථානයක් (ගල්වළක්) වශයෙන් භාවිත වී ඇත.
- අපේක්ෂිත අභිමතාර්ථ ඉටුකර ගැනීමට පෙර මෙම ස්ථානය අතහැර දමන ලද බව හඳුනාගත හැක.
- සමස්ත භූ දර්ශනය අනුව මෙම කලාපය භික්ෂූන් වහන්සේලා ගේ නේවාසික කලාපය වූ බව උපකල්පනය කළ හැකි වේ.



# ගල්ගුහා අංක 1




- කටාර කපා ඇති ගල්ගුහා දෙකක් ස්තූපය පිහිට පර්වතය උතුරු දිසාවෙන් වූ ප්‍රපාතයට පහතින් පිහිටා ඇත.
- **ගුහා අංක 1** : විහාරයේ ප්‍රධාන පිවිසුමට වම් පසින් ගමන් කිරීමේ දී පළමු ව හමුවන ගුහාවයි.
- කටාර කපා ඇති අතර උතුරු දිසාවට මුහුණ ලූ මෙම ගුහාව බටහිර-නැගෙනහිර දිසාවට ව්‍යාප්ත ව ඇත.
- උපරිම දිග මී. 12.20ක් වන අතර උපරිම පළල මී. 3.58කි. කටාරයේ උපරිම ස්ථානයට උස මී. 5කට ආසන්න වේ.
- ගුහාවේ කටාරයේ අර්ධයක් කඩාවැටීමට ලක් වී ඇති අතර දැනට ශේෂගත කොටසේ කටාරයට පහළින් හෝ ඉහළින් ලිපියක් අප ගේ නිරීක්ෂණයට හසු වුයේ නැත.

# ගල්ගුහා අංක 2

- **ගුහා අංක 2** : ස්තූපය පිහිට පර්වතයේ ස්තූපයට පහළින් ඊසාන දෙසින් පිහිටා ඇත.
- මෙම ගුහාවේ උපරිම දිග මී. 31ක් වන අතර උපරිම පළල මී. 4.20ක් හා උපරිම උස මී. 7කට ආසන්න ය.
- මෙම ගුහාවේ කටාර ගණනාවක් තිබීම විශේෂ ලක්ෂණයකි. ඒ අනුව විවිධ මට්ටමින් විවිධ දිග ප්‍රමාණයේ කටාර 8ක් දැකගත හැකි වේ.
- මෙම ගුහාවේ ඇතුළු ප්‍රදේශය කොටස් වලට බෙදාතිබුණු ආකාරය පවතින ලක්ෂණ අනුව උපකල්පනය කළ හැකි වේ.
- මෙම ගුහාවේ මැද කොටසේ එක් කොටසක දැව බාල්ක රැඳවීමට සකසා ඇති අතර අවම වශයෙන් මෙම ස්ථානයේ ගුහා භිත්තිය සිතුවම් වලින් සරසා තිබූ ආකාරයේ සාධක ශේෂගත වී ඇත.
- සම්පූර්ණයෙන් ම පාහේ විනාශ ගොස් පැවතියත් ඉතා කුඩා සිතුවම් පදාසයක් තවමත් ශේෂ වි ඇත.
- මෙම ගුහාව තුළ හා තදාශ්‍රිත ව ඉහළ පවතින ස්තූපයට අයත් විය හැකි ගඩොළු කැට හා කොටස් විසිරී පවතී.
- ඉහළ සිට හෙළන ලද අපද්‍රව්‍ය මේ තුළ රැස් වී පැවතීම සිතට අප්‍රියතාවක් ඇති කරයි.



# කොටවෙහෙර හෙවත් පුරාණ දීගලක විහාරයේ අභිලේඛන

- ලාහුගල කොටවෙහෙරේ පිවිසුම හා තදාශ්‍රිත කලාපයේ ඇති අභිලේඛන පිළිබඳ දළ විස්තරයක් මේ මගින් ඉදිරිපත් කෙරේ.
- මේවා අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ මහාචාර්ය **කරුණාසේන හෙට්ටිආරච්චි** මහතාගෙන් ලැබුණු දායකත්වය ඉමහත් ය.
- 2012.07.08 දිනයේ අභිලේඛන ස්පර්ශ ලාංඡන සකසන ලදී.
- ශ්‍රී ලංකා පු.වි.දෙ. විසින් සිදුකර ඇති ගවේෂණයක දී ගිරිලිපි 7ක් හඳුනාගෙන ඇත. මෙම ගවේෂණයේ දි ගිරිලිපි 11ක් හඳුනා ගන්නා ලදී.
- මෙම ලිපි 10ක් ම විහාරයේ ප්‍රධාන පිවිසුම හා සම්බන්ධ වන ලෙස ගලෙහි නෙලා ඇත.
- සමහර ලිපි වල කොටස් පූර්ණ හෝ අර්ධ වශයෙන් හායනය වී ඇතත් අර්ථයක් ලබාගැනීමට හැකි මට්ටමක පවති.
- මෙම ලිපි අතුරින් මෑත කාලයට ආසන්න ම ලිපිය පමණක් ආවාසයට (2012 ජූලි) ආසන්නයේ පිහිටි ගල්කුළක සටහන් කර ඇත.



- ක්‍රි.ව. 1 සියවසේ සිට ක්‍රි.ව. 6/7 සියවස් දක්වා කාලපරාසයකට මෙම ලිපි අයත් වුවත් ලිපි වලින් බහුතරය ක්‍රිස්තු වර්ෂ ආරම්භක සියවස් වලට අයත් වේ.
- මෙම ලිපි දිගලක මහවිහාරය නමින් හැඳින් වූ විහාරයට කරන ලද පූජාවන් පිළිබඳ විස්තර සඳහන් කළ නෛතික ලේඛන වශයෙන් හඳුනාගත හැක.
- එක් ලිපියක මෙම විහාරයේ පවත්වන ලද අරියවස පිංකම සඳහා සිදුකළ පරිත්‍යාගයක් පිළිබඳ ව විස්තර සඳහන් ව ඇති
- අප්‍රකට ව පැවති මෙම විහාරයේ නම මෙහි ඇති අභිලේඛන 3කින් ම අනාවරණය වේ.
- මෙම ලේඛන ප්‍රභූ ජනයා විසින් කරවන ලද ලේඛන බව හඳුනා ගැනීම උගහට ය.
- අන්තර්ගතය අනුව මෙම ලිපි බහුතරය සාමාන්‍ය හෝ ප්‍රදේශීය ප්‍රභූ කොටස් විසින් සටහන් කරවන ලද ඒවා බව අනුමාණ කළ හැක.

# 1 වැනි ලිපිය

- තනි පෙළක් වශයෙන් සටහන් කර ඇති මෙම ලිපියේ සම්පූර්ණ දිග සෙන්ටිමීටර් 136කි.
- මෙම ලිපිය යහපත් මට්ටමින් සංරක්ෂණය වී ඇත.
- එල්ලාවල මේධානන්ද හිමියන් විසින් මේ පිළිබඳ ව අදහස් දක්වා ඇත.
- එ තුමා විසින් මෙම ලිපිය *වව්ගමකහි තෙරහ* යනුවෙන් කියවා ඇති අතර වැව්ගමෙහි තෙර විසින් කළ යන ආකාරයට විවවරණ සපයා ඇත.
- එම කියවීම සමඟ අප ගේ කියවීම තරමක් වෙනස් වේ.



# 2 වැනි ලිපිය

- තනි පෙළක් වශයෙන් සටහන් කර ඇති මෙම ලිපිය 1 වැනි ලිපිය පිහිටි ස්ථානයට මදක් ඉහළට වන්නට වයඹ-ගිණිකොණ දිශානුගත ව සටහන් කර ඇත.
- අනාවරණය වී ඇති අභිලේඛන අතුරින් දිගම ලිපිය වශයෙන් හඳුනාගත හැකි මෙම ලිපිය සෙන්ටිමීටර් 453ක දිගකින් යුතු වේ.
- මෙම ලිපියේ අවසාන වශයෙන් සටහන් ව ඇතැයි සිතිය යුතු ප්‍රදානය සිදුකරන්නා ගේ නම සහිත කොටස විනාශ වි ගොස් ඇත.
- ක්ෂේත්‍ර නිරීක්ෂණ අනුව මෙම කොටස සැලකිය යුතු තරම් අතීත කාලයකදී ම සිතාමතා ම විනාශ කොට ඇති බව සිතිය හැකි වේ.




# 3 වැනි ලිපිය

- සෙ.මී. 186ක දිගකින් හා සේ.මී. 58ක පළලකින් යුතු මෙම ලිපියේ පේළි 4කි.
- ප්‍රධාන පිවිසුම ආරම්භයේ වම් පසින් ස්ථාන ගත වී ඇත.



# 4 වැනි ලිපිය

- ප්‍රධාන පිවිසුම ආරම්භයේ වම් පසින් පිහිටා ඇති අභිලේඛනයන්ගෙන් එකකි.
- මේ ලිපිය සාපේක්ෂ ව යහපත් මට්ටමින් සුරැකී ඇත.
- සම්පූර්ණ දිග සෙ.මී. 144ක් වන අතර පළල සෙ.මී. 50ක් වේ. මෙම ලිපිය පේළි හතරකින් යුතු වේ.
- දෙ වැනි පේළියේ දී මෙම විහාරයේ නම දීගලක මහ විහාරය බැව් දැක් වේ.




# 5 වැනි ලිපිය

- ප්‍රධාන පිවිසුමේ ආරම්භක ස්ථානයේ වම් පසින් ස්ථානගත වී ඇති ලිපි අතුරින් එක් ලිපියකි.
- සම්පූර්ණ දිග සෙ.මී. 100ක් හා පළල සෙ.මී. 54ක් පමණ වේ.
- ලිපිය පේළි 6කින් සැකැසී ඇති අතර ආරම්භයේ *සිද්ධම* යන ආශිර්වාදාත්මක යෙදුම සටහන් කර ඇත.




# 6 වැනි ලිපිය

- ස්තූපයට ආසන්නයේ ම පිහිටා ඇති ලිපිය වන මෙම ලිපිය මෙම ස්ථානයෙන් දැනට අනාවරණය වී ඇති විශාල ම ලිපිය වශයෙන් හඳුනා ගැනීමට පුළුවන.
- මෙම ලිපිය දිග සෙ.මී. 212ක් හා පළල සෙ.මී. 180ක් වේ.
- ලිපිය පේළි 10ක් වන ලෙස සටහන් කර ඇත.



## 7 වැනි ලිපිය

- බෙහෙවින් ම හායනය වී ඇති ලිපියයි.
- මෙම ලිපියේ පේළි තුනක් ඇති අතර තැනින්තැන අකුරු කීපයක් කියවා ගත හැක.
- සම්පූර්ණ දිග සෙ.මී. 130ක් හා පළල සෙ.මී. 28ක් පමණ වේ.
- විහාරයේ භික්ෂූන් ගේ සිව්පසය සඳහා කළ පරිත්‍යාග පිළිබඳ විස්තර අන්තර්ගත වී ඇත.



## 8 වැනි ලිපිය

- තනි පේළි ලේඛනයකි. ස්පර්ශ ලාංඡනය පරීක්ෂා කිරීමේ දී පහළින් තවත් අක්ෂර පේළියක් සටහන් වී ඇති බව ඡායාමාත්‍ර වශයෙන් හඳුනාගත හැකි වේ. නමුත් මෙම අක්ෂර පේළිය කියවා ගැනීමට තරම් ප්‍රමාණවත් අන්දමින් සුරැකී නොමැත.
- පැහැදිලි අකුරු දැක්වෙන පෙළ පමණක් මෙහි දි අවධානයට යොමුකළ හැකි වේ.



# 9 වැනි ලිපිය

- ප්‍රධාන පිවිසුම් ගල්පඩිපෙළේ මධ්‍යයේ දකුණු පසට වන ලෙස මෙම ලිපිය ස්ථානගත වී ඇති අතර තනි පෙළක් වශයන් සටහන් කර ඇත.
- මෙම ලිපියේ සම්පූර්ණ දිග ප්‍රමාණය සෙ.මී. 140ක් වේ.




# 10 වැනි ලිපිය

- ප්‍රධාන පිවිසුම ආරම්භයේ වම් පසින් දැක්වෙන ලිපි අතුරින් පහළ ම මට්ටමේ පිහිටා ඇති ලිපියක් වන මෙම ලිපිය පේළි තුනකින් සටහන් කර ඇත.
- සම්පූර්ණ දිග සෙ.මී. 160ක් හා පළල සෙ.මී. 54ක් වේ.
- මැද පේළියෙහි දීගලක මහ විහර යන්න පැහැදිළි ආකාරයෙන් හඳුනාගත හැක.



# 11 වැනි ලිපිය

- මෑත කාලයට ආසන්න ම ලිපිය වශයෙන් මෙම ලිපියයි.
- මෙම ලිපිය සටහන් කර ඇත්තේ දැනට සංඝාවාසය වශයෙන් භාවිත වන ගොඩනැගිල්ලේ දකුණු පසින් පිහිටි ගල්කුළු අතුරින් එක් ගලක පිවිසුම් මාර්ගයට දක්නට හැකි වන ආකාරයෙනි.
- පේළි 5කින් සමන්විත මෙම ලිපිය සෙ.මී. 73ක දිගකින් හා සෙ.මී. 33ක පුළුලකින් යුතු වේ.



# සමෝධානය

- පුරාකෘති හා වාස්තුවිද්‍යා අවශේෂ හඳුනා ගනිමින් වාර්තා කිරීමට හැකි විය.
- අභිලේඛන කීපයක් ම අනාවරණය කරගැනීමට හැකි වීම.
- පුරාණ නම ඉහළ විශ්වාසයකින් යුතු ව අනාවරණය කරගැනීමට හැකි වීම.
- දුටුගැමුණු වෘත්තාන්තය සමඟ ඇති සබඳතාව කෙබඳු ද යන්න අනාවරණය කරගැනීමට ප්‍රමාණවත් සාධකය හෙළි වී නැත.
- මෙම ස්ථානයේ අප ගේ ඇසට ලක් වූ ප්‍රමාණයට වඩා බෙහෙවින් වැඩි පුරාකෘති ප්‍රමාණයක් අපගෙන් ගිලිහී ගොස් තිබීමට ද පුළුවන.
- කොටවෙහෙර ප්‍රධාන කොටස පමණක් දැනටත් මනුෂ්‍ය පරිහරණයේ පවතී.
- සම්පත්, මුදල්, තාක්ෂණය හා පිරිස් බලය අතින් වඩා පොහොසත් පිරිසකට මෙම ස්ථානය පිළිබඳ ව වඩාත් සාර්ථක අධ්‍යයනයක් දියත් කිරීමට අවස්ථාව ඇත.

# ස්තූතිය

ලාහුගල කොටවෙහෙර හෙවත් පුරාතන දීගලක මහා විහාර ගවේෂණය සපුරාගැනීම සඳහා සුධීන් ගණනාවකගේ අනුග්‍රහය හා සහයෝගය ඉවහල් විය.

- කොටගල විහාරවාසි **පූජ්‍ය ගෝනවල පියනන්ද** හාමුදුරුවන් වහන්සේට
- කොටගල විහාරය, ලාහුගල මඟුල් මහාවිහාරය, කිරිවෙහෙර, නීලගිරි සෑය යන විහාරයන් ගේ විහාරාධිපති **පූජ්‍ය හුලංනුගේ රතනසාර** හාමුදුරුවන් වහන්සේට
- **පූජ්‍ය එල්ලාවල මෙධානන්ද** හාමුදුරුවන් වහන්සේට
- අභිලේඛන පිටපත් සකස් කිරීමේ දී සහයෝගය ලබාදුන් සුමිත් ලියනගේ, මහින්ද කරුණාරත්න, කළිඳු ඥානසේන හා මංජු යන මිතුරණට
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්‍ෂ (අභිලේඛන හා නානක විද්‍යා) **නාමල් කොඩිතුවක්කු** මහතාට
- මඟපෙන්වීම් සිදුකළ හා නොයෙක් ආකාරයෙන් සහයෝගය ලබාදුන් ග්‍රාමාරක්‍ෂක බලකායේ සේවයේ නියුතු වරාලන්දේ **ඒ.ඒ. අනුර නිශ්ශංක**, තැම්ටියවල, **පී. චන්ද්‍ර ගුණසේන** හා **සිරිල් සුරංග** යන මහතුනට කෘතවේදී ස්තූතිය පුදකළ යුතු වේ.



# ආශ්‍රිත ග්‍රන්ථ හා ලිපි

*ධාතුවංසය* (සිරි තිලකසිරි සංස්කරණය)

2010 - ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*මහාවංසෝ* (මංගල ඉලංගසිංහ සංස්කරණය)

2006 - ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

*මහාවංශය* (බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ සංස්කරණය)

2009 - බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

මෙධානන්ද හිමි, එල්ලාවල,

2008 - *නවතම ශිලාලිපි ගවේෂණ*, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.

2008 - *පාචීන පස්ස - උත්තර පස්ස නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය*, දයාවංශ ජයකොඩි සහ සමාගම, මරදාන. 146-150 පි.

2012 - *මාගම රාජධානිය*, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ.

*රාජාවලිය* (ඒ. වී. සුරවීර සංස්කරණය)

1997 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

*ලාහුගල කොටවෙහෙර සංවර්ධන සැලසුම*, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

*වංසත්ථප්පකාසිනි* මහාවංස ටීකාව (සිංහල අනුවාදය, අකුරටියේ අමරවංස නාහිමි හා හේමචන්ද්‍ර දිසානායක)

1994 - පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනය (කැලණිය විශ්වවිද්‍යාලය), කොළඹ.

සේනාධීර, පී.

1964 - *රුහුණේ අප්‍රකට පුරාවස්තු*, සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ.

Nicholas, C.W.

1963 - Historical Topography of Ancient and Medieval Ceylon, *Journal of the Ceylon Branch of the Royal Asiatic Society*, New Series, Volume VI, Special Number, Colombo. 23-24pp.

Paranavitana, S.

1970 - *Inscriptions of Ceylon*, Vol. I, Department of Archaeology, Ceylon. 56p.